# සම්පත් පැතිකඩ
# 2025



## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
## වඳුරඹ

# පටුන

## පළමු වන පරිච්ඡේදය

### 1.හැඳින්වීම


1.1 පිහිටීම

1.2 ග්‍රාම නිලධාරී වසම්

1.3 භූ විද්‍යාත්මක  වැදගත්කම

1.4 භූ විෂමතාවය හා ජලවහනය

1.5 පස

1.6 බෑවුම් කලාප

1.7 වර්ෂාපතන ව්‍යාප්තිය

1.8 කෘෂි පාරිසරික කලාප

1.9 ගංවතුරින් යටවන ප්‍රදේශ

1.10 පොලිස් බල ප්‍රදේශ

1.11 ගොවිජන කේන්ද්‍රස්ථාන

1.12 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස

1.13 රෙජිස්ට්‍රාර් කොට්ඨාස

1.14 සමෘද්ධි  කලාප

1.15 මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස

1.16 මැතිවරණ බල ප්‍රදේශ

1.17 වසම් වලට අයත් ගම්


## ➢ දෙවන පරිච්ඡේදය

### 2. ජනගහනය, රැකිරක්ෂා හා ආදායම


2.1 ජන ව්‍යාප්තිය

2.2 ජාතිකත්වය අනුව ජනගහනය

2.3  ආගම අනුව  ජනගහනය

2.4  ජන ව්‍යාප්තිය වයස අනුව

2.5  අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය

2.6 ප්‍රදේශයේ දැනට පාසල් අධ්‍යාපනය ලබන ළමුන් සංඛ්‍යාව

2.7 කොට්ඨාසයේ විදේශගත පුද්ගලයින්ගේ සංඛ්‍යාව

2.8 වසමේ රාජ්‍ය නිලධාරීන්

2.9 සේවා නියුක්තිය

2.10 සේවා වියුක්තිය

2.11 වසමේ සිටින ශ්‍රම බලකාය

2.12 වයස අනුව රැකියා ව්‍යාප්තිය

2.13රැකියා නොමැති ශ්‍රම බලකාය

2.14 අංශ  අනුව රැකියාවන්ගේ බෙදී යාම

2.15 වසමේ විදේශගත පුද්ගලයින්

- <u>තුන් වන පරිච්ඡේදය</u>

## 3. පවුල් තොරතුරු

3.1 පවුලක මාසික ආදායම අනුව ජන ව්‍යාප්තිය

3.2 පවුල් තොරතුරු

3.3 නිවාස හා ඉඩම් තොරතුරු

3.4 සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ තොරතුරු

3.5 පානීය ජල පහසුකම් පිළිබඳ තොරතුරු

3.6 වහලේ ස්වභාවය

3.7 බිත්ති වල ස්වභාවය

3.8 ගෙබිම

3.9 විදුලි පහසුකම් පිළිබඳ තොරතුරු

3.10 දුරකතන පහසුකම් පිළිබඳ තොරතුරු

3.11 ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු

3.12 ඉඩමේ ස්වභාවය පිළිබඳ තොරතුරු

3.13 මුළු භූමි ප්‍රමාණය

- <u>හතර වන පරිච්ඡේදය</u>

## 4. සත්ව පාලන කටයුතු

4.1 එළ ගව පාලනය

4.2 මී ගව පාලනය

4.3 එළු පාලනය

4.4 කුකුළු පාලනය

- <u>පස් වන පරිච්ඡේදය</u>

## 5. සංවර්ධනය විය යුතු පාලම් හා මාර්ග

5.1 මාර්ග තොරතුරු

5.2 සංවර්ධනය විය යුතු පාලම්

5.3 සංවර්ධනය විය යුතු මාර්ග

- <u>හය වන පරිච්ඡේදය</u>

## 6. වාරිමාර්ග හා ජලජීවී

6.1 වාරි පහසුකම් පිළිබඳ තොරතුරු

6.2 විසිතුරු මත්ස්‍ය කර්මාන්තය

- **<u>හත් වන පරිච්ඡේදය</u>**

**7. සංවිධාන තොරතුරු**

7.1 ලියාපදිංචි ග්‍රාම සංවර්ධන සමිති

7.2 අවමංගල්‍යාධාර සමිති

7.3 කොට්ඨාසයට අයත් යෞවන සමාජ

7.4 කොට්ඨාසයේ ළමා සමාජ

7.5 ලියාපදිංචි /ප්‍රතිසංවිධානය කරන ලද ක්‍රීඩා සමාජ

7.6 සමෘද්ධි පුජා මූල සමිති

7.7 ගොවි සමිති

7.8 ලියාපදිංචි කාන්තා කාර්ය සංවිධාන

- **<u>අට වන පරිච්ඡේදය</u>**

**8. පොදු ආයතන හා අධ්‍යාපන ආයතන තොරතුරු**

8.1 කොට්ඨාසයේ පවතින පොදු ආයතන

8.2 මූල්‍ය ආයතන තොරතුරු

8.3 බලශක්තිය හා සන්නිවේදනය

8.4 කොට්ඨාසයේ පාසල් සම්බන්ධ තොරතුරු

8.5 කොට්ඨාසයේ පෙර පාසල් සම්බන්ධ තොරතුරු

8.6 ජීව වායු ඒකක පිළිබඳ තොරතුරු

8.7 කොට්ඨාසයේ ළමා නිවාස

8.8 කොට්ඨාසයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන

- **<u>නව වන පරිච්ඡේදය</u>**

**9. ප්‍රවාහන හා යටිතල පහසුකම්**

9.1 වසමේ ඇති මෝටර් වාහන සංඛ්‍යාව

9.2 වසමේ ඇති වෙළෙඳ ආයතන

9.3 කොට්ඨාසයේ ලියාපදිංචි වී ඇති රථවාහන

➢ **<u>දහ වන පරිච්ඡේදය</u>**

## 10. නිලධාරී තොරතුරු

10.1 අත්‍යාවශ්‍ය දුරකතන අංක නාමාවලිය

10.2 දිස්ත්‍රික්කය තුල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

10.3 වසම් වලට අයත් ග්‍රාම නිලධාරීන් පිළිබඳ තොරතුරු

10.4 කොට්ඨාසයේ වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරීන් පිළිබඳ තොරතුරු

10.5 කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් පිළිබඳ තොරතුරු

10.6 කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු

10.7 කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පිළිබඳ තොරතුරු

➢ **<u>එකොළොස් වන පරිච්ඡේදය</u>**

## 11. ආගමික ස්ථාන හා පොදු පහසුකම්

11.1 කොට්ඨාසයේ දහම් පාසල්

11.2 කොට්ඨාසයේ විහාරස්ථාන

11.3 කොට්ඨාසයේ කෝවිල්

11.4 කොට්ඨාසයේ පල්ලි

11.5 තැපැල් හා උප තැපැල් කාර්යාල

11.6 සෞඛ්‍ය පහසුකම් පිළිබඳ දත්ත

11.7 කොට්ඨාසයේ බෙහෙත් ඔසු සැල් පිළිබඳ තොරතුරු

11.8 ආයුර්වේද වෛද්‍යවරු පිළිබඳ තොරතුරු

➢ **<u>දොළොස් වන පරිච්ඡේදය</u>**

## 12. රජයේ ආධාර

12.1 සහනාධාර පිළිබඳ තොරතුරු

12.2 වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේ ආපදාවන් පිළිබඳ තොරතුරු

➢ **<u>දහතුන් වන පරිච්ඡේදය</u>**

**13. විශේෂ ස්ථාන**

13.1 විල්ගමු රජමහා විහාරය

13.2 ලේල්වල ගලපාත පුරාණ මහා විහාරය

13.3 කිරින්දලාහේන වැව

13.4 දොලහේන රක්ෂිතය

➢ **<u>දාහතර වන පරිච්ඡේදය</u>**

**14. කර්මාන්ත හා වෙනත් ව්‍යාපාර**

14.1 කොට්ඨාසයේ කර්මාන්ත පිළිබඳ හැදින්වීම

14.2 තේ කර්මාන්ත ශාලා

14.3 පෞද්ගලික වතු

14.4වෙනත් කර්මාන්ත

14.5 ව්‍යාපාරික ස්ථාන

14.6 වී මෝල්

14.7 ඉදල් නිෂ්පාදනය

14.8 ලී මෝල්

14.9 කුකුල් ගොවිපළ

14.10 වැල්ඩින් වැඩ

14.11 ලියාපදිංචි පැල තවාන්කරුවන්ගේ විස්තර

14.12 රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියාව

14.13 මෝටර් වාහන සේවා

14.14 මෝටර් ගරාජ්

14.15 පාපැදි අලුත්වැඩියාව

14.16 රසකැවිලි නිෂ්පාදනය

14.17 මදුරු දැල් / මෙට්ට කවර

14.18 බාබර් සාප්පු

14.19 කුළුබඩු නිෂ්පාදන

14.20 බිම්මල් කර්මාන්තය

14.21 පොල්තෙල් කර්මාන්තය

14.22 කැටයම් කර්මාන්තය

14.23 කොන්ක්‍රීට් නිෂ්පාදන

14.24 පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන

14.25 විසිතුරු මසුන්

14.26 කොස් ආශ්‍රිත නිෂ්පාදන

- **<u>පහළොස් වන පරිච්ඡේදය</u>**

## 15. පාසල් ප්‍රතිඵල තොරතුරු

15.1 පාසල් වල උසස් පෙළ ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු

15.2 පාසල් වල සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු

15.3 පාසල් වල ශිෂ්‍යත්ව ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු

# පළමු වන පරිච්ඡේදය

## 1. හැඳින්වීම

ගාල්ල යනු මුහුදට ඉතාමත් සමීපව පිහිටා ඇති ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි අගනගරයයි. එය යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙස නම් කර තිබේ. ගාලු වරාය ඉන්දියන් සාගරය තුළ පිහිටීම නිසාම ගාල්ල පුරාණයේ සිටම වෙළෙඳ නගරයක් ලෙස ප්‍රසිද්ධව පවතී. ගාල්ල දිස්ත්‍රික්කය තුල සුවිශේෂී ස්ථාන රාශියක් පිහිටා ඇත. විදේශික සිත් ඇද බැඳ ගන්නා සුළු ගාල්ල නගරය ඉතා අයස්කාන්ත සුළුය.

ගාල්ල නගරයෙන් කිලෝමීටර 18 ක් පමණ රට තුලට වන්නට වඳුරඹ නම් සුන්දර ගම්මානය පිහිටා ඇත. ගාලු දිසාවේ ග්‍රාම නිලධාරි වසම් 22 කින් හා පවුල් 8501 කින් ද සමන්විතව සොඳුරු පෙදෙසක පිහිටා ඇති වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අතීතයේ පටන් ගහකොළ තුරුලතා වලින් ගහන වූත්, බුදුදහමේ ආශිර්වාදයෙන් හා කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත වූ සොඳුරු මිනිසුන්ගෙන් පිරි ජීවත්වීමට සුදුසු වූ තෝතැන්නකි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2% ක් වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා සලකා බැලීමේදී විශාලත්වයෙන් දෙවන කුඩාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ.

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා ඈත අතීතයකට හිමිකම් කියනු ලබන අතර පුරාණ පොත් පත් හා ග්‍රන්ථවලද ඒ බව සඳහන්ව වී ඇත. "වඳුරඹ" යනුවෙන් නම සැදී ඇත්තේ කෙසෙල් බහුල ප්‍රදේශයක වඳුරන් බොහෝ සේ ගැවසීම නිසා බව ප්‍රකට කියමනකි. මීට අමතරව "වඳුරඹ" නම සැදීම වටා නොයෙක් කතා වස්තූන් හා කියමන්ද බැඳී පවතී.

අර්ධ නාගරික හා ග්‍රාමීය ජන ජීවිතයකින් හෙබි මෙම කොට්ඨාසයේ ප්‍රධාන ජීවනෝපාය වශයෙන් අතීතයේ පැවත ඇත්තේ වී ගොවිතැනය. අතිතයේ ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන වුවද වර්තමානයේ එය අභිබවා තේ වගාව මෙන්ම රබර්, පොල් සහ සුළු අපනයන බෝග ද පෙරමුණ ලබාගෙන ඇත. නමුත් වර්තමානයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් තේ වගාවද හැඳින්විය හැකිය. මෙයට අමතරව රබර්, පොල්, කුරුඳු සහ සුළු අපනයන භෝග ද, ගෙවතු වගාව ද දැකිය හැකිය. එසේම වර්තමානයේ ප්‍රදේශයේ ප්‍රචලිත වෙමින් පවතින වගාවක් ලෙස ගෙවතු වගාව හඳුන්වා දිය හැකිය.

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ඓතිහාසික හා පුරා විද්‍යාත්මක ස්ථාන අතුරින් දඹදෙණි යුගයට අයත් මාබොටුවන පුරාණ විල්ගමු රජමහා විහාරය වැදගත් ස්ථානයක් ගනී. එමෙන්ම මෙම කොට්ඨාසයේ ප්‍රධාන ජල පෝෂකය වන්නේ කොට්ඨාසයේ මායිමෙන් සහ විටෙක කොට්ඨාසය මැදින් ගලා බස්නා ඇල අමුණු වේ. එමෙන්ම, නීල් ද අල්විස් මහතා විසින් නිර්මාණය කරන ලද කොට්ඨාසය මධ්‍යයේ පිහිටි අක්කර 5 ක පමණ වපසරියකින් යුතු කිරින්දලාහේන වැව ද කොට්ඨාසයේ සුන්දරත්වය වඩාත් ඔප් නංවයි. වැව මධ්‍යයේ පිහිටි අක්කරයක පමණ වපසරියකින් යුතු කුඩා දූපත කාගෙත් සිත් ඇද බැඳ ගන්නා සුළු අයස්කාන්ත ස්ථානයකි. එසේම වැව වටා බැඳි බන්ට් වේල්ල සංචාරක ආකර්ෂණය තවත් ඔප් නංවයි. මීට අමතරව ස්වභාව සෞන්දර්ය විඳගත හැකි බොහෝ ස්ථාන කොට්ඨාසය තුල පවතී.

එමෙන්ම මෙම කොට්ඨාසය තුළ පිහිටා ඇති අක්කර 64 ක වපසරියකින් යුතු දොළහේන රක්ෂිතය නිවර්තන වැසි වනාන්තර ඝනයට අයත්වේ. ග්‍රාම නිලධාරි වසම් තුනකට මායිම්ව පිහිටා ඇති අතර සුන්දරත්වය තවත් වැඩිකරමින් රක්ෂිතය මධ්‍යයෙන් දොල පාරක් ගලා බසී.

ගලපාත පුරාණ රජමහා විහාරයද ඓතිහාසික හා පුරා විද්‍යාත්මක ස්ථාන අතුරින් වැදගත් ස්ථානයක් හිමි කර ගනී. ඉතා මනස්කාන්ත පරිසරයකට හිමිකම් කියනු ලබන ගලපාත විහාරය හා පැරණි දේවාලය සංචාරකයින් සඳහා සිත් ඇද ගන්නා සුවිශේෂි ස්ථානයක් වේ.

පරිපාලනමය පහසුව උදෙසා මෙම කොට්ඨාසය බද්දේගම කොට්ඨාසයෙන් වෙන් කර ග්‍රාම නිලධාරී වසම් 22 කට බෙදා ඇත. එම ග්‍රාම නිලධාරී වසම් 22 ද විවිධ ආයතනවල අවශ්‍යතාවයන් අනුව කොටස් වශයෙන් ගොනු කරගෙන ඇත.

## 1.1 පිහිටීම (LOCATION)

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ නිරිත දිග කොටසෙහි පිහිටි ගාල්ල දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 අතුරින් වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල නගරයට කි.මී. 18 ක් දුරින් වයඹ ගිනිකොණ දිශානුගතව පිහිටා ඇත.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,

උතුරු අක්ෂාංශ $6^0$ - 5' හා $6^0$ - 10' අතර ද,
නැගෙනහිර දේශාංශ $80^0$-10' හා $80^0$ - 19' අතර ද, පිහිටා ඇත.

උතුරින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, නැගෙනහිරින් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, බටහිරින් බෝපේ-පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ද මායිම් වේ.

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්ග ප්‍රමාණ හෙක්ටයාර් 4500 ( වර්ග කිලෝමීටර් 45) කි. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2% කි. එය කුඩාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් එකක් ලෙස සැලකිය හැකිය.





## 1.2 ග්‍රාම නිලධාරී වසම්

කුඩාම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී වසම් සැලකිල්ලට ගැනීමේදී විවිධ අවස්ථාවල වෙනස්වීම් සිදු වී ඇත. වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 22 වර්ග ප්‍රමාණ අනුව බලන විට කුඩාම ග්‍රාම නිලධාරී වසම කිරින්දලාහේන වන අතර එහි වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 70 කි. විශාලතම ග්‍රාම නිලධාරී වසම මාබොටුවන වන අතර වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 486 කි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම් අංකය | ග්‍රාම නිලධාරී වසමේ නම | භූමි ප්‍රමාණය (හෙක්) | භූමි ප්‍රමාණය ($km^2$) |
|---|---|---|---|---|
| 1 | 186 ඒ | ඉඳුරුපත්විල | 176 | 1.76 |
| 2 | 186 ඩී | වැයිහේන | 195 | 1.95 |
| 3 | 189 | මාබොටුවන | 486 | 4.86 |
| 4 | 189 ඒ | නාත්තෙවෙල | 305 | 3.05 |
| 5 | 189 බී | තලාව | 262 | 2.62 |
| 6 | 190 | ඉහළ ලේල්වල | 183 | 1.83 |
| 7 | 190 ඒ | කුඹලමලහේන | 114 | 1.14 |
| 8 | 190 බි | පංවිල | 88 | 0.88 |
| 9 | 191 | පහළ ලේල්වල | 193 | 1.93 |
| 10 | 191 ඒ | කොකාවල | 235 | 2.35 |
| 11 | 191 බී | පොල්ගහවිල | 136 | 1.36 |
| 12 | 191 සි | දෙයියන්දර | 115 | 1.15 |
| 13 | 191 ඩී | කිරින්දලාහේන | 70 | 0.7 |
| 14 | 200 | මැදකීඹිය | 172 | 1.72 |
| 15 | 200 ඒ | මැදකීඹිය නැගෙනහිර | 163 | 1.63 |
| 16 | 200 බී | පිටිහරාව | 271 | 2.71 |
| 17 | 200 සී | තිරුවානකැටිය | 202 | 2.02 |
| 18 | 207 | ඉහළ කීඹිය | 361 | 3.61 |
| 19 | 207 ඒ | ඉහළ කීඹිය දකුණ | 256 | 2.56 |
| 20 | 221 | වඳුරඹ උතුර | 167 | 1.67 |
| 21 | 221 ඒ | වඳුරඹ දකුණ | 185 | 1.85 |
| 22 | 221 බි | ගුළුගහකන්ද | 165 | 1.65 |
| **එකතුව** | | | **4500** | **45** |


(මූලාශ්‍රය: ගාල්ල දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය)











































## 1.3 භූ විද්‍යාත්මක වැදගත්කම (GEOGRAPHICAL SIGNIFICANCE )

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විද්‍යාත්මක තොරතුරු විමසා බැලීමේ දී ප්‍රාග් කේම්බ්‍රිය යුගයට අයත් පාෂාණ වලින් නිර්මාණය වී ඇත.



| පාෂාණ වර්ගය | සංකේතය | ප්‍රතිශතය |
|---|---|---|
| චාකොනයිට්ස් | CH | 49 |
| මාබල්,ඩොලමයිට් සහ ග්‍රැනයිට් නයිස් | MDG | 14 |
| බයොටයිට් නයිස් හා හෝන් බ්ලෙන්ඩ් | BH | 10 |
| මෙටා අවසාදිත | UN | 27 |
| එකතුව | 100 | |

## 1.4 භූ විෂමතාවය හා ජලවහනය (TOPOGRAPHY AND DRAINAGE)

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූ විෂමතාවය සලකා බලන විට නිරිතදිග පහත් බිම් කොටසට අයත් වේ.

මෙහි සඳහන් ග්‍රාම නිලධාරී වසම් කොකාවල අඩි 300, කිරින්දලාහේන අඩි 300, දෙයියන්දර අඩි 200, මාබොටුවන අඩි 300, තලාව අඩි 100, වදුරඹ උතුර අඩි 200 යනාදී ලෙස උන්නතාංශයන් දක්වයි. ඒ අනුව වදුරඹ කොට්ඨාසයේ ජලවහනය සලකා බැලීමේදී ජලාකාර ජලවහනයක් පෙන්නුම් කරයි. කොට්ඨාසයෙහි ප්‍රධාන ජල පෝෂක වන්නේ කොට්ඨාසය මැදින් ගලා බස්නා ඇල අමුණු වේ.



## 1.5 පස (SOILS)

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊසාන හා නැගෙනහිර කොටසෙහි විශාල වශයෙන් ව්‍යාප්තව ඇත්තේ තද ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් සහ ක්වාට්ස් සහිත පසයි. ගඟ ආශ්‍රිත පහත් මිටියාවත්වල විශාල වශයෙන් අර්ධ හැල් පස හා දියළු මිශ්‍රිත පස දක්නට ලැබේ. වදුරඹ කොට්ඨාසයේ පාංශු ව්‍යාප්තිය පහත සඳහන් කර ඇත.

| සංකේතය | පාංශු වර්ගය |
|---|---|
| A1 | අර්ධ හැල්පස හා දියළු මිශ්‍රිත පස |
| A2 | මිශ්‍ර දියළු පස සහිත හියුමික්ග්ලේ දියළු පස |
| A3 | දියළු මිශ්‍රිත පස |
| A4 | ලවණ ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් පස |
| B2 | තද ලැටරයිට් සහිත රතු කහ පොඩ්සෝලික් පස සහ ක්වාට්ස් සහිත රතු කහ පොඩ්සෝලික් පස |
| C1 | වර්ණක සහිත රතු කහ පොඩ්සෝලික් පස සහ රතු කහ පොඩ්සෝලික් |
| C2 | වර්ණක සහිත රතු කහ පොඩ්සෝලික් පස කැපී පෙනෙන තට්ටුව සහිත (කඳු සහ බාදිත ප්‍රදේශ) |
| C3 | හියුමික් ග්ලේ දියළු පස සහිත හැල් පස |

## 1.6 බෑවුම් කලාප (SLOPE CLASSES MAP)

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මධ්‍යයට වන්නට දළ බෑවුම් ප්‍රදේශ පොල්ගහවිල ග්‍රාම නිලධාරී වසම් වලින් දක්නට ලැබීම සුවිශේෂී වේ.

0% - 8% අතර බෑවුම් කලාපයට අයත් විශාල ප්‍රදේශයක් දක්නට ඇත. මෙයට ප්‍රධාන හේතුව බස්නාහිර කොටස වෙරළ බඩ තැනිතලා ප්‍රදේශයට ආසන්න වීමයි.

8% - 16% අතර බෑවුම් කලාපයට අයත් ප්‍රදේශ ඇති වසම් ලෙස තිරිවානකැටිය, ඉහලකීඹිය, පිටිහරාව, පහළ ලේල්වල, කිරින්දලාහේන යන ග්‍රාම නිලධාරී වසම් දැක්විය හැක.

16% -30% අතර බෑවුම් කලාපයට අයත් ප්‍රදේශ ඇති වසම් ලෙස පොල්ගහවිල, ඉහළලේල්වල, වදුරඹ උතුර, නාත්තෙවෙල, පිටිහරාව යන ග්‍රාම නිලධාරී වසම් ඇතුලත් වේ.

තව ද බෑවුම් කලාපයට අයත් ග්‍රාම නිලධාරී වසම් ලෙස ගුළුගහකන්ද, මාබොටුවන හා තලාව යන ප්‍රදේශ දැක්වේ.

| ශ්‍රේණිය | බෑවුම් පන්තිය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| B | 8% - 16% | 8% |
| C | 16% - 30% | 10% |
| D | 30% - 60% | 2% |
| E | 60% | 1% |
| | **එකතුව** | **21%** |

## 1.7 වර්ෂාපතන ව්‍යාප්තිය ( RAIN FALL ISOHYETS)

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වර්ෂාපතන ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී වර්ෂාපතන ව්‍යාප්තිය ප්‍රධාන කලාප 2ක් හඳුනා ගත හැකිය.

වර්ෂාපතනය මිලිමීටර් 3000 – 4000 ත් අතර ප්‍රදේශය A ලෙස,
වර්ෂාපතනය මිලිමීටර් 2500 – 3000 ත් අතර ප්‍රදේශය B ලෙස ද දක්වා ඇත.

සමස්තයක් වශයෙන් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මිලිමීටර් 2500 ට වඩා වැඩි අධික වර්ෂාපතනයක් ලබන කාලපරිච්ඡේද හෝ අධික උෂ්ණත්වයක් පවතින කාලපරිච්ඡේද හඳුනාගත නොහැකි අතර පහතරට තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස දැක්විය හැකිය.



## 1.8 කෘෂි පාරිසරික කලාප (AGRO ECOLOGICAL REGIONS)

වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පහත රට තෙත් කලාපයට (WL) අයත්වේ. වර්ෂාපතනය උන්නතාංශය හා පස පදනම් කරගෙන උප කොටස් වලට බෙදෙන මෙම කොට්ඨාසය WL2/WL4 කෘෂි පාරිසරික කලාප වලට අයත් වේ.

WL2/WL4 කලාප මීටර් 300ට අඩු පහත රට තෙත් කලාපයයි. මෙම කලාපය මිලිමීටර් 1500 ක පමණ වර්ෂාපතනයක් ලබයි. අවුරුද්ද පුරාම වර්ෂාපතනයක් ලබන නිරිත දිග පහත් බිම් ප්‍රදේශය වන මෙම කලාප නිරිත දිග මෝසම් මඟින් උපරිම වර්ෂාපතනයක් මැයි සිට සැප්තැම්බර් දක්වා ලබයි.

## 1.9 ගංවතුරින් යටවන ප්‍රදේශ ( FLOOD DETENTION AREAS)

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුරින් යටවන ප්‍රදේශ පිළිබඳ සැලකීමේ දී විශේෂ අවධානයක් යොමු වන්නේ කුඹලමලහේන වසම වෙතටයි. ගිං ඟඟ ආශ්‍රිතව වසම පිහිටා ඇති හෙයින් මහා ගං වතුරකදී පවුල් 05 ක් පමණ පීඩාවට පත් වේ.

එසේම අනෙකුත් කොට්ඨාස හා සැසඳීමේ දී මෙම කොට්ඨාසයේ පවතින ගංවතුර අවධානම ඉතා අඩු මට්ටමක පවතී.

## 1.10 පොලිස් බල ප්‍රදේශ (POLICE AREA)

වදුරඹ ප්‍රාදේශීය බල ප්‍රදේශය වදුරඹ පොලිස් ස්ථානයට අයත් වේ.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | වසමට අයත් පොලිස් ස්ථානය |
|---|---|---|
| 01 | 186ඒ ඉදුරුපත්විල | වදුරඹ |
| 02 | 186ඩී වැයිහේන | වදුරඹ |
| 03 | 189 මාබොටුවන | වදුරඹ |
| 04 | 189ඒ නාත්තෙවෙල | වදුරඹ |
| 05 | 189බී තලාව | වදුරඹ |
| 06 | 190 ඉහළ ලේල්වල | වදුරඹ |
| 07 | 190ඒ කුඹලමලහේන | වදුරඹ |
| 08 | 190බී පංවිල | වදුරඹ |
| 09 | 191 පහළ ලේල්වල | වදුරඹ |
| 10 | 191ඒ කොකාවල | වදුරඹ |
| 11 | 191බී පොල්ගහවිල | වදුරඹ |
| 12 | 191සී දෙයියන්දර | වදුරඹ |
| 13 | 191ඩී කිරින්දලාහේන | වදුරඹ |
| 14 | 200 මැදකීඹිය | වදුරඹ |
| 15 | 200 ඒ මැදකීඹිය නැගෙනහිර | වදුරඹ |
| 16 | 200බී පිටිහරාව | වදුරඹ |
| 17 | 200සී තිරුවානකැටිය | වදුරඹ |
| 18 | 207 ඉහලකීඹිය | වදුරඹ |
| 19 | 207 ඒ ඉහලකීඹිය දකුණ | වදුරඹ |
| 20 | 221 වදුරඹ | වදුරඹ |
| 21 | 221 ඒ වදුරඹ දකුණ | වදුරඹ |
| 22 | 221 බී ගුළුගහකන්ද | වදුරඹ |

## 1.11 .ගොවිජන කේන්ද්‍රස්ථාන

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම් | වසමට අයත් ගොවිජන කේන්ද්‍ර |
|---|---|---|
| 01 | 186 ඒ ඉඳුරුපත්විල | වඳුරඹ |
| 02 | 189 මාබොටුවන | වඳුරඹ |
| 03 | 189 ඒ නාත්තෙවෙල | වඳුරඹ |
| 04 | 189 බී තලාව | වඳුරඹ |
| 05 | 190 ඉහළ ලේල්වල | වඳුරඹ |
| 06 | 190 ඒ කුඹලමලහේන | වඳුරඹ |
| 07 | 190 බී පංවිල | වඳුරඹ |
| 08 | 191 පහළ ලේල්වල | වඳුරඹ |
| 09 | 191 ඒ කොකාවල | වඳුරඹ |
| 10 | 191බී පොල්ගහවිල | වඳුරඹ |
| 11 | 191ඩී කිරින්දලාහේන | වඳුරඹ |
| 12 | 200 මැදකීඹිය | වඳුරඹ |
| 13 | 200 ඒ මැදකීඹිය නැගෙනහිර | වඳුරඹ |
| 14 | 200 බී පිටිහරාව | වඳුරඹ |
| 15 | 200 සී තිරුවානකැටිය | වඳුරඹ |
| 16 | 207 ඉහළ කීඹිය | වඳුරඹ |
| 17 | 207ඒ ඉහළ කීඹිය දකුණ | වඳුරඹ |
| 18 | 221 වඳුරඹ | වඳුරඹ |
| 19 | 221ඒ වඳුරඹ දකුණ | වඳුරඹ |
| 20 | 221බී ගුළුගහකන්ද | වඳුරඹ |
| 21 | 191 සී දෙයියන්දර | වඳුරඹ |
| 22 | 186 ඩී වැයිහේන | වඳුරඹ |

## 1.12 .පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කොට්ඨාස

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාසය |
|---|---|---|
| 01 | 190 ඉහළ ලේල්වල | ඉහළ ලේල්වල |
| 02 | 190 පංවිල | ඉහළ ලේල්වල |
| 03 | 189 ඒ නාත්තෙවෙල | වඳුරඹ දකුණ |
| 04 | 221 ඒ වඳුරඹ දකුණ | වඳුරඹ දකුණ |
| 05 | 189 මාබොටුවන | මාබොටුවන |
| 06 | 189 බී තලාව | මාබොටුවන |
| 07 | 191 ඒ කොකාවල | කොකාවල |
| 08 | 191 සී දෙයියන්දර | කොකාවල |
| 09 | 200 මැදකීඹිය | මැදකීඹිය |
| 10 | 200 ඒ මැදකීඹිය නැගෙනහිර | මැද කීඹිය |
| 11 | 200 සී තිරුවානකැටිය | මැදකීඹිය නැගෙනහිර |
| 12 | 200බී පිටිහරාව | මැදකීඹිය නැගෙනහිර |
| 13 | 207 ඉහලකීඹිය | ඉහලකීඹිය |
| 14 | 207 ඒ ඉහලකීඹිය දකුණ | ඉහලකීඹිය |
| 15 | 186 ඩී වැයිහේන | ඉඳුරුපත්විල |
| 16 | 186 ඒ ඉඳුරුපත්විල | ඉඳුරුපත්විල |
| 17 | 191 පහළ ලේල්වල | පහළ ලේල්වල |
| 18 | 191 බී පොල්ගහවිල | පහළ ලේල්වල |
| 19 | 191 ඩී කිරින්දලාහේන | පහළ ලේල්වල |
| 20 | 221 වඳුරඹ | වඳුරඹ උතුර |
| 21 | 221 බී ගුළුගහකන්ද | වඳුරඹ උතුර |
| 22 | 190 ඒ කුඹලමලහේන | වඳුරඹ උතුර |

## 1.13. රෙජිස්ට්‍රාර් කොට්ඨාස

| ලේල්වල රෙජිස්ට්‍රාර් කොට්ඨාස |
|---|
| මාබොටුවන |
| නාත්තේවල |
| තලාව |
| ඉහළ ලේල්වල |
| කුඹලමලහේන |
| පංවිල |
| පහළ ලේල්වල |
| කොකාවල |
| පොල්ගහවිල |
| දෙයියන්දර |
| කිරින්දලාහේන |
| මැදකීඹිය |
| මැදකීඹිය නැගෙනහිර |
| පිටිහරාව |
| තිරුවානකැටිය |
| ඉහළ කීඹිය |
| ඉහළ කීඹිය දකුණ |
| ඉදුරුපත්විල |
| වැයිහේන |
| වඳුරඹ |
| වඳුරඹ දකුණ |
| ගුළුගහකන්ද |

ඉහත වසම් අනුව උප්පැන්න මරණ ලියාපදිංචිය සිදු වුවද ගහබඩ පත්තුව විවාහ කොට්ඨාසයේ මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම රෙජිස්ටාර් නිලධාරින්ට රාජකාරි කටයුතු කිරීමට හැකියාව ඇත.

## 1.14 සමෘද්ධි කලාප

බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සමෘද්ධි කලාප 05කට බෙදා ඇත. නමුත් දැනට වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බද්දේගම කොට්ඨාසයෙන් වෙන්ව නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ව පවතින බැවින් නව සමෘද්ධි කලාප 02ට බෙදා ඇත.

| **ඉහල ලේල්වල සමෘද්ධි බැංකුවට අයිති කලාප** | **වඳුරඹ සමෘද්ධි බැංකුවට අයිති කලාප** |
|---|---|
| 186ඒ ඉඳුරුපත්විල | 200 මැද කීඹිය |
| 186ඩී වැයිහේන | 221ඒ වඳුරඹ දකුණ |
| 190 ඉහළ ලේල්වල | 189 ඒ නාත්තේවල |
| 190 ඒ කුඹලමලහේන | 207ඒ ඉහළ කීඹිය දකුණ |
| 191 පහළ ලේල්වල | 191ඒ කොකාවල |
| 191ඩී කිරින්දලාහේන | 191සී දෙයියන්දර |
| 191බී පොල්ගහවිල | 200ඒ මැදකිඹිය නැගෙනහිර |
| 221වඳුරඹ උතුර | 200බී පිටිහරාව |
| 221බී ගුළුගහකන්ද | 200සී තිරුවානකැටිය |
| 189බී තලාව | 207ඉහළ කීඹිය |
| 189මාබොටුවන | 190බී පංවිල |

## 1.15 මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාසය තවමත් බද්දේගම කොට්ඨාසයයි.

| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී කොට්ඨාසය | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කොට්ඨාස | ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|
| වදුරඹ | ඉහල ලේල්වල | ඉහල ලේල්වල |
| | මාබොටුවන | මාබොටුවන |
| | ඉහල ලේල්වල | පංවිල |
| | වදුරඹ උතුර | කුඹලමලහේන |
| | වදුරඹ දකුණ | නාත්තෙවල |
| | කොකාවල | කොකාවල |
| | වදුරඹ උතුර | ගුළුගහකන්ද |
| | මාබොටුවන | තලාව |
| | කොකාවල | දෙයියන්දර |
| | වදුරඹ උතුර | 221 වදුරඹ |
| | වදුරඹ දකුණ | වදුරඹ දකුණ |
| ඉදුරුපත්විල | ඉදුරුපත්විල | වැයිහේන |
| | ඉදුරුපත්විල | ඉදුරුපත්විල |
| | පහල ලේල්වල | පොල්ගහවිල |
| | පහල ලේල්වල | කිරින්දලාහේන |
| | | පහල ලේල්වල |
| ඕවිලාන | මැදකීඹිය | 200 මැදකීඹිය |
| | | 200 ඒ මැදකීඹිය නැගෙනහිර |
| | මැදකීඹිය නැගෙනහිර | පිටිහරාව |
| | | තිරුවානකැටිය |
| | ඉහලකීඹිය | ඉහලකීඹිය දකුණ |
| | ඉහලකීඹිය | ඉහලකීඹිය |

## 1.16 මැතිවරණ බල ප්‍රදේශ

වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බද්දේගම මැතිවරණ බල ප්‍රදේශයට අයත්ය. බද්දේගම මැතිවරණ බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 52 න් වසම් 22 ක් වදුරඹ බල ප්‍රදේශයට අයත්ය.

| අනු අංකය | මැතිවරණ බල ප්‍රදේශය | ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|
| 01 | **7 ඊ බද්දේගම** | 186ඒ ඉඳුරුපත්විල |
| 02 | | 186ඩී වැයිහේන |
| 03 | | 189 මාබොටුවන |
| 04 | | 189ඒ නාත්තේවෙල |
| 05 | | 189බී තලාව |
| 06 | | 190 ඉහළ ලේල්වල |
| 07 | | 190ඒ කුඹලමලහේන |
| 08 | | 190බී පංවිල |
| 09 | | 191 පහළ ලේල්වල |
| 10 | | 191ඒ කොකාවල |
| 11 | | 191බී පොල්ගහවිල |
| 12 | | 191සී දෙයියන්දර |
| 13 | | 191ඩී කිරින්දලාහේන |
| 14 | | 207ඒ ඉහළ කීඹිය |
| 15 | | 207ඒ ඉහළ කීඹිය දකුණ |
| 16 | | 221 වදුරඹ |
| 17 | | 221 ඒ වදුරඹ දකුණ |
| 18 | | 221 බී ගුළුගහකන්ද |
| 19 | | 200 මැදකීඹිය |
| 20 | | 200 ඒ මැදකීඹිය නැගෙනහිර |
| 21 | | 200 බී පිටිහරාව |
| 22 | | 200 සී තිරුවානකැටිය |

## 1.17 වසම් වලට අයත් ගම්

| අනු අංකය | වසම | ගමේ නම |
|---|---|---|
| 01 | 186 ඒ ඉදුරුපත්විල | ඉදුරුපත්විල/කොස්ගහකන්ද |
| 02 | 186 ඩී වැයිහේන | බර්සල්දෙණිය / ජයසේකර මාවත ගහලකොළදෙණිය / වහුගාලකන්ද / සරප්පුවතුරාව ප්‍රධාන මාර්ගය |
| 03 | 189 මාබොටුවන | මාබොටුවන |
| 04 | 189 ඒ නාත්තේවල | නාත්තේවල |
| 05 | 189 බී තලාව | තලාව |
| 06 | 190 ඉහළ ලේල්වල | ඉහල ලේල්වල උතුර / ඉහල ලේල්වල දකුණ |
| 07 | 190 ඒ කුඹලමලහේන | කුඹලමලහේන |
| 08 | 190 බී පංවිල | පංවිල / ලේල්වල වත්ත |
| 09 | 191 පහළ ලේල්වල | පහල ලේල්වල උතුර / පහල ලේල්වල දකුණ / ලේල්වල වත්ත |
| 10 | 191 ඒ කොකාවල | වරකපිටිකන්ද / කොකාවල / ලේල්වල වත්ත |
| 11 | 191 බී පොල්ගහවිල | පොල්ගහවිල |
| 12 | 191 සී දෙයියන්දර | දෙයියන්දර / ඉලුක්මණ්ඩිය / කොතේගොඩ |
| 13 | 191 ඩී කිරින්දලාහේන | කිරින්දලාහේන |
| 14 | 200 මැදකීඹිය | මැදකීඹිය |
| 15 | 200 ඒ මැදකීඹිය නැගෙනහිර | මැදකීඹිය නැගෙනහිර |
| 16 | 200 බී පිටිහරාව | පිටිහරාව/කොතේගොඩ |
| 17 | 200 සී තිරුවානකැටිය | තිරුවානකැටිය |
| 18 | 207 ඉහළකීඹිය | වීවරුගොඩ / 48 කන්ද / ඉහල කීඹිය / වත්තහේන / තුවක්කුදෑ හේන/එනසල් හේන |
| 19 | 207 ඒ ඉහළකීඹිය දකුණ | පල්ලිගොඩ / පුවක්ගස්හේන / කොස්ගහහේන / මානන්තැන්න / නාගහහේන / පිටදෙණිය / පන්නමග වත්ත |
| 20 | 221 වදුරඹ | වදුරඹ උතුර / මගහේන / තුංකැටිවිල |
| 21 | 221 ඒ වදුරඹ දකුණ | වදුරඹ දකුණ/පංවිල කොටස/නාත්තෙවල කොටස/ඉලගොටුකන්ද/තුංකැටිවිල/ඩේවිඩ්සන් වත්ත කොටස |
| 22 | 221 බී ගුළුගහකන්ද | මහහේන / ගුළුගහකන්ද / මනෝමනිය / නැහිනිගල / කොස්ගොඩකන්ද / ගුළුගහකන්ද ( වත්ත කොටස) |

# දෙවන පරිච්ඡේදය


## 2.ජනගහනය , රැකීරක්ෂා හා ආදායම

### 2.1 ජන ව්‍යාප්තිය

2025 වර්ෂයේ වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් අනුව මුළු ජනගහනය **29109** කි. මුළු පවුල් සංඛ්‍යාව **850**1 කි.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ස්ත්‍රී | පුරුෂ | එකතුව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | 186 ඒ ඉදුරුපත්විල | 565 | 532 | 1097 | 350 |
| 02 | 186 ඩී වැයිහේන | 859 | 816 | 1675 | 480 |
| 03 | 189 මාබොටුවන | 1381 | 1191 | 2572 | 621 |
| 04 | 189 ඒ නාත්තේවල | 723 | 671 | 1394 | 451 |
| 05 | 189 බී තලාව | 370 | 378 | 748 | 230 |
| 06 | 190 ඉහළ ලේල්වල | 739 | 698 | 1437 | 382 |
| 07 | 190 ඒ කුඹලමලහේන | 366 | 339 | 705 | 210 |
| 08 | 190 බී පංවිල | 539 | 489 | 1028 | 295 |
| 09 | 191 පහළ ලේල්වල | 748 | 724 | 1472 | 439 |
| 10 | 191 ඒ කොකාවල | 730 | 699 | 1429 | 405 |
| 11 | 191 බී පොල්ගහවිල | 389 | 397 | 786 | 251 |
| 12 | 191 සී දෙයියන්දර | 721 | 637 | 1358 | 386 |
| 13 | 191 ඩී කිරින්දලාහේන | 331 | 327 | 658 | 186 |
| 14 | 200 මැදකීඹිය | 869 | 784 | 1653 | 451 |
| 15 | 200 ඒ මැදකීඹිය නැගෙනහිර | 811 | 703 | 1514 | 431 |
| 16 | 200 බී පිටිහරාව | 658 | 680 | 1338 | 404 |
| 17 | 200 සී තිරුවානකැටිය | 444 | 440 | 884 | 270 |
| 18 | 207 ඉහළකීඹිය | 834 | 814 | 1648 | 539 |
| 19 | 207 ඒ ඉහළකීඹිය දකුණ | 936 | 965 | 1901 | 536 |
| 20 | 221 වදුරඹ | 656 | 616 | 1272 | 408 |
| 21 | 221 ඒ වදුරඹ දකුණ | 657 | 670 | 1327 | 404 |
| 22 | 221 බී ගුළුගහකන්ද | 597 | 616 | 1213 | 372 |
| **එකතුව** | | **14923** | **14186** | **29109** | **8501** |

## 2024 වර්ෂය තුල ජන ව්‍යාප්තිය




## 2025 වර්ෂය තුළ ජන ව්‍යාප්තිය

